**ශීර්ෂය - 406 -සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 07 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල අමාත්‍යාංශය වෙතින් ලබාගත් රු. 10,359,937 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් අයිතම 331 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතයට ගනිමින් පැවතුණ ද 2021 නොවැම්බර් 20 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව එම වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දින වන විටත් විදුලිබල අමාත්‍යාංශය විසින් ලබා දුන් වත්කම් විධිමත් ව රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා නොතිබුණ බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් නොකරන ලදී. | 2021 නොවැම්බර් 20 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගන්නා ලද රු. 1,849,246 ක් වටිනා වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මිලදී ගන්නා ලද වත්කම් අපේක්ෂිත ගුණත්වයෙන් නොපැවතීම මත ගිණුම්ගත නොකරන ලද අතර 2021 ජනවාරි මස නැවත අදාළ ආයතනය වෙත ආපසු යවන ලදී. | සියළුම වත්කම් මිල දී ගන්නා ලද අවස්ථාවේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත් එසේ කටයුතු නොකිරීම මත රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයට අදාළව පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මඟින් වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.1,500,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර, එය | විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී ඇතැම් කරුණු පිළිබඳ ව පුරෝකථනය කිරීමේ හැකියාවක් නොපැවතීම තුළ මෙම අඩුපාඩුව සිදු වී ඇත. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සමඟ සැසඳීමේ දී සියයට 200 සිට 500 දක්වා විය. | | |
| (ආ) වැය විෂයය 06 ක් සඳහා සලසා ගෙන තිබූ රු. 345,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 100 ක් ම හා තවත් වැය විෂයයන් 11 ක් සඳහා සලසාගෙන තිබූ රු.7,265,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 31 සිට සියයට 92 ක් දක්වා උපයෝජනය නොකර පැවතුණි. | පුරෝකථනය කළ නොහැකි ආර්ථික හා සමාජීය වාතාවරණය තුළ සපයා තිබූ ප්‍රතිපාදන භාවිතයට ගැනීමේ අවශ්‍යතාවය නොපැවතීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

**2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඉතා කෙටි කාලයක දී ස්ථාපනය කිරීමට සියලුම ආකාරයේ උත්සාහ ගන්නා ලද අතර, 2021 වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 සහ 5.2 ඡේදයන් හි සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | මෙම අඩුපාඩුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** මු.රෙ. 138,139 | මුදල් රෙගුලාසිවල සඳහන් ක්‍රමානුකූල ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව රු. 11,885.71 ක් වටිනා ගෙවීම් කර තිබුණි. | විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. | ගෙවීම් කිරීමේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** VI වැනි පරිච්ඡේදයේ 2 : 10 ඡේදය | මෙම ඡේදය ප්‍රකාරව නිලධාරින්ගේ වැටුප් වර්ධක අනුමත කිරීම්, වැඩබැලීමේ පත්වීම්, මාරු වීම් වැනි කරුණු පිළිබඳව ද විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | නිලධාරින් බඳවාගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අත්හැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යමණ්ඩල වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යමණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසානයේ දී ම මසක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 09 වන දින ස්ථාපනය කරන ලද සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, එදින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාකාරී සැලැස්මකින් තොරව කටයුතු කර තිබුණි. තවද, 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර අනුමැතිය සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතු වුවත්, ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.2 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණ ද රු. 1,849,246 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් මිලදී ගෙන තිබුණි. තවද, 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු වුවත්, ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 128 (1) (ඉ) සහ 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එහි 3.1 ඡේදයේ දක්වා ඇති කාලරාමුව තුළ සෑම අමාත්‍යාංශයක් විසින් ම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | විදුලිබල අමාත්‍යාංශය වෙතින් ලබාගත් වත්කම් පවරාගෙන නොතිබුණු අතර මිලදී ගත් වත්කම් 2021 ජනවාරි මස ආපසු අදාළ ආයතනය වෙත යැවූ බැවින් භාණ්ඩ සමීක්ෂණය සිදු නොකරන ලදි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 ජුලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් එකඟ වූ තිරසර | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | අමාත්‍යාංශයට ඍජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණු කවරේද යන්න නිශ්චිතව හඳුනා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන අරමුණු 17 අතුරින් සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට සෘජුවම අදාළ වන තිරසර සංවර්ධන අරමුණු කවරේද යන්න නිශ්චිතව හඳුනා ගෙන නෙතිබුණි. | | |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2020 වර්ෂය තුළ අභ්‍යන්තර චක්‍රලේඛ හෝ මඟපෙන්වීම් නිකුත් කිරීම හෝ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හෝ සිදු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඇ) | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මානව, භෞතික සම්පත් හා මූල්‍ය ප්‍රතිපාදන කවරේද යන්න හඳුනා ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | මේ සඳහා අවශ්‍ය මානව, භෞතික සම්පත් හා මූල්‍ය ප්‍රතිපාදන කවරේද යන්න හඳුනාගත යුතු වීම. |
| (ඈ) | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ ක්‍රමවේදයක් මෙන්ම ඒ සම්බන්ධ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ ක්‍රමවේදයක් මෙන්ම ඒ සම්බන්ධ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගත යුතු වීම. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA / 01- 2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක් සඳහා ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු යටතේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර 2021 වර්ෂයේ සිට අදාළ පරිදි කටයුතු කරමි. | ජාතික විගණන පනත හා අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

නිලධාරියෙකු ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර එමඟින් තම අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි.

## 5.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ අවශ්‍යතාවයන් සඳහා සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA / 01- 2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් තම අමාත්‍යාංශය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා එහි 5.3 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද 2020 අගෝස්තු 09 වන දින සිට වාර්තාවේ දින දක්වා එලෙස කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජාතික විගණන පනත හා අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |